# සමන්තකූටවණ්ණනාවේ අන්තර්ගතය පිළිබඳ විවරණයක්

වැලිවිට සොරත හිමි

## හැඳින්වීම:-

ක්‍රි. පූ. හයවන සියවසේ සිට වර්තමානය දක්වා ම ක්‍රමානුකූල ව දියුණු වෙමින් පැවති පාලි සාහිත්‍ය ඉතිහාසය තුළ ගද්‍ය, පද්‍ය හා මිශ්‍ර යනුවෙන් විවිධ සාහිත්‍යාංග බිහි වී ඇත. පෘථුල ලෙස සලකා බැලීමේ දී එය ප්‍රධාන වශයෙන් යුග කිහිපයක් යටතේ සංවර්ධනය වෙමින් පැවති බව කිව හැකිය. පළමුවෙනි යුගයට අයත් වන්නේ බුද්ධභාෂිත දේශනා අන්තර්ගත ත්‍රිපිටක පාළියයි. ප්‍රථම ධර්ම දේශනාවේ පටන් දේශනා කරන ලද සියලු ධර්ම කොටස් ඇතුළත් වූයේ ත්‍රිපිටකයටයි. බුද්ධකාලීන භාරතයේ ආරම්භ වූ එකී දේශනා සම්පූර්ණත්වයට පත්වූයේ තුන්වන ධර්ම සංගායනාව ආරම්භ වීමට ප්‍රථමය. මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ විසින් පරවාද ඛණ්ඩණය හා සකවාද මණ්ඩණය කරමින් දේශිත කථාවත්ථුප්පකරණය රචනා වීමෙන් පසු ත්‍රිපිටකය සම්පූර්ණ විය. දෙවැනි යුගයට අයත් වන්නේ ත්‍රිපිටකයෙන් පසුව හා බුද්ධඝෝෂ හිමියන් විසින් රචිත අට්ඨකථා රචනා වීමට ප්‍රථම බිහි වූ කෘතීන්ය. මේ යුගයට අයත් වන්නේ නෙත්තිප්පකරණ, පේටකෝපදේස, මිලින්දපඤ්හ හා සුත්ත සංගහ යන කෘතීහුය. මීට අමතර ව වර්තමානයේ විද්‍යමාන නොවූණත් බොහෝ ග්‍රන්ථ මේ යුගයට අයත් ව පැවතුණේ යැයි විද්වතුන්ගේ මතයයි.[1] තෙවෙනි යුගයට අයත් වන්නේ බුද්ධඝෝෂ හිමියන්ගේ ද ඔහුගේ සමකාලීනයන්ගේ හා පශ්චාත්කාලීනයන්ගේ ද අට්ඨකථා කෘතීන්ය. ත්‍රිපිටකයට කරන ලද විවරණ ග්‍රන්ථ වන මේවා පස්වෙනි ශතවර්ෂයේ පටන් සංගෘහිත වුවත් ඊට ප්‍රථම නිසැක වශයෙන් ම පුරාණතර ලේඛනයන් තිබෙන්නට ඇතැයි සැලකිය හැකිය. සිවුවෙනි යුගයට අයත් වන්නේ පොළොන්නරු යුගයේ රචිත ටීකා ග්‍රන්ථ බිහි වීමයි. පස්වෙනි යුගය ලෙස සැලකෙන්නේ පොළොන්නරු යුගයේ සිට වර්තමානය දක්වා නොයෙක් වකවානුවල නොයෙක් විද්වතුන් විසින් වංසකථා, ව්‍යාකරණ, කාව්‍ය, ප්‍රකරණ,



ඡන්දස්, කෝෂ හා අන්‍ය ලෞකික විෂයයන් අලලා රචනා කරන ලද ග්‍රන්ථයන්ය.

මෙකී සාහිත්‍යාංග අතුරින් පාලි පද්‍ය කාව්‍ය ග්‍රන්ථ ඉදිරි පියවරක් තබා ඇත්තේ පොළොන්නරු යුගයෙන් පසුවය. එනම් දඹදෙණි යුගයේ දී රචිත පද්‍ය ග්‍රන්ථවලිනි. පාලි පද්‍ය සාහිත්‍ය කෘති අතර දක්නට ලැබෙන සද්ධම්මෝපායන, රසවාහිනී වැනි ග්‍රන්ථවල තෙරුවන් ගුණ, පාපයෙහි ආදීනව, කුසල් වැඩීමේ අගය වැනි කරුණු විස්තර කෙරේ. දාඨාවංස, බෝධිවංස, ථූපවංස, ධාතුවංස, ඡකෙස ධාතුවංස වැනි කෘතිවල ආගමික වස්තූන් විෂය කොට ගත් තොරතුරු අන්තර්ගත වේ. හත්ථවනගල්ලවිහාරවංස, සමන්තකූටවණ්ණනා වැනි කෘතිවල ආගමික සිද්ධස්ථාන පිළිබඳ තොරතුරු අන්තර්ගත වේ. මහාවංස, දීපවංස, සාසනවංස, අභිනව සාසනවංස වැනි කෘතිවල ජාතික හා ආගමික ඉතිහාසය වස්තු විෂය වී ඇති අතර ජිනචරිත, මහාකස්සපත්ථෙර චරිත, සාරිපුත්තත්ථෙර චරිත වැනි කෘතිවල බුදුන්ගේ හා ශ්‍රාවකයන්ගේ ශ්‍රේෂ්ඨ චරිත වර්ණනා කර තිබේ. මෙම ග්‍රන්ථ අතුරින් බොහෝමයක් 'වංස' නාමයෙන් හඳුන්වා ඇති අතර ඒවායෙහි බහුල වශයෙන් දැකිය හැක්කේ ගද්‍ය, පද්‍ය හෝ මිශ්‍ර යන කාව්‍ය ලක්ෂණ නිසා කාව්‍ය සාහිත්‍යයට අයත් කෘති යැයි හැඳින්විය හැකිය. සම්පිණ්ඩනය කර දැක්වීමේ දී සෑම ග්‍රන්ථයකම පාහේ ආගමික, දේශපාලනික, සාමාජික තොරතුරු අන්තර්ගත වී තිබේ. එයිනුත් බොහෝමයක් ග්‍රන්ථවල දක්නට ලැබෙන්නේ විවිධ පුද්ගල යින්, බෞද්ධ පූජනීය වස්තු හෝ ස්ථාන පදනම් කරගෙන ඒවා වර්ණනාවට ලක් කිරීමය. මහාවංසයේ තේමාව වන්නේ ඉතිහාස කථා පුවත් ගෙන ඒම වුවත් සෑම පරිච්ඡේදයක් අවසානයේ ම එන බොහෝ ගාථා ආගමික නැඹුරුතාවයකින් යුක්තව රචනා කර තිබේ. එපමණක් නොව පරිච්ඡේද අවසානයේ එන ''ඉති සුජනප්පසාද සංවෙගාය කතෙ මහාවංසෙ ....... පරිච්ඡේදො''[2] යන පාඨයෙන් කිය වෙන්නේ ''මෙසේ හුදී ජනයාගේ පහන් සංවේගය පිණිස කළ මහාවංසයේ ....... පරිච්ඡේදය'' අවසන් වන බව කියාය. එයින් මහාවංස කතුවරයා අපේක්ෂා කර ඇත්තේ මේ තුළින් සමාජයට දහම් පණිවිඩයක් ලබා දීමටය.

## සමන්තකූටවණ්ණනාවේ කර්තෘ හා කාල නිර්ණය

ආගමික නැඹුරුතාව ඇති ග්‍රන්ථයක් තුළින් බලාපොරොත්තු වන්නේ එය කියවන පාඨකයාගේ සිත් සතන් තුළ පහන් සංවේගයක් ඇති කරලීමයි. එය ඊට ආවේණික වූවක් යැයි කිව හැකිය. සමන්තකූටවණ්ණනා කාව්‍යය ද එම ගණයෙහි ලා සැලකිය හැකි ග්‍රන්ථයකි. මෙය රචනා කර ඇත්තේ ආරණ්‍යවාසයට අයත් රාහුල නම් තෙර නමකගේ ආරාධනයෙන් 13 වන සියවසේ විසූ වනවාසී වේදේහ නම් තෙර නමකි. අරණ්‍යවාසී සඟ පරපුර ග්‍රාමවාසී සඟ පරපුර මෙන් ම පාලි සාහිත්‍යයේ මෙන් ම බෞද්ධ ආගමික දියුණු ව උදෙසා අනුපම මෙහෙයක් ඉටුකළ සංඝ පරම්පරාවකි. වේදේහ තෙරුන් පොළොන්නරු පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ සිදුකළ ශාසන සංශෝධනයෙන් පසු සංඝරාජ පදවියට පත් වනරතන ආනන්ද නම් තෙර කෙනෙකුගේ ශිෂ්‍යවරයෙකු බව ග්‍රන්ථාවසානයේ එන කර්තෘ සංදර්ශන ගාථාවලින් පෙනේ.[3] මොහු බ්‍රාහ්මණ වංශිකයෙකු වන අතර සිංහල ශබ්ද ලක්ඛණ නම් ග්‍රන්ථයක් කළ බව ද සඳහන් වේ. මේ සද්දලක්ඛණය වනාහි සිංහල භාෂාවේ ව්‍යාකරණය සඳහා රචනා වී ඇති මහාර්ඝ ග්‍රන්ථයක් වන සිදත් සඟරාවයි. සමන්තකූටවණ්ණනාවේ නිගමන ගාථාවල එන විස්තර යට අනුව සද්දලක්ඛණය පිළිබඳ එහි සඳහන් වීම නිසා සමන්තකූටවණ්ණනාව මුන්වහන්සේගේ දෙවෙනි කෘතිය සේ සැලකේ. අනෙක් ග්‍රන්ථය වන්නේ රසවාහිනියයි. එය අවසානයට රචිත කෘතියයි.

විල්හෙල්ම් ගෛගර් හා ගුණපාල මලලසේකර යන විද්වතුන් ගේ මතයට අනුව මුන්වහන්සේ ක්‍රි. ව. 14 වන සියවසේ විසූ තෙර නමකි.[4] කේ. ආර්. නෝර්මන් මහතා දක්වන්නේ 13 වන සියවසේ අග භාගයේ හෝ 14 වන සියවසේ මුල් භාගයේ සිටින්නට ඇති බවය.[5] චාල්ස් ගොඩකුඹුර මහතාගේ මතය වන්නේ ද මුන්වහන්සේ 13 වන සියවසේ විසූ තෙරනමක් ලෙසය.[6] පොල්වත්තේ බුද්ධදත්ත හිමියන්ගේ මතයට අනුව වේදේහ හිමියන්ගේ ආචාර්යවරයා වූ වනරතන හිමියන් මහා පරාක්‍රමබාහු රජුට පෙර විසූවෙකි. ඒ අනුව වේදේහ හිමියන් ද මහා පරාක්‍රමබාහු රජුගෙන් ටික කලකට පසු වැඩසිටි තෙර නමක් යැයි පෙන්වාදිය හැකිය.[7] කෙසේ නමුත් ඓතිහාසික වාර්තාවලට අනුව මේ කාලය වනවිට වේදේහ හිමියන් අයත්ව සිටි ආරණ්‍ය



වාසී සම්ප්‍රදායේ මූලස්ථානය වූයේ පළාබත්ගලයි. (පාලි-පුටභත්ත සෙල) සමන්තකූටවණ්ණනාවේ ආරාධකයා වූ රාහුල හිමියන් හා වේදේහ හිමියන් සමනළ කන්ද පෙනෙන තෙක් මානයෙහි වූ පළාබත්ගල සේනාසනයක වැඩ වෙසෙමින් සාහිත්‍ය කෘති රචනා කිරීමේ කාර්යය කළේ යැයි අනුමාන කළ හැකිය. තමන් සිටි දිසාවට පූර්ව දිශාවෙන් සමනළ කන්ද පිහිටි බව කතුවරයා ග්‍රන්ථාභ්‍යන්තරයෙහි එන එක් ගාථාවකින් පෙන්වා දෙයි.

''සමන්තචක්ඛු වූ බුදුරජාණන් වහන්ස, මහී කාන්තාවගේ ඔටුන්නෙහි ශ්‍රීය උසුලන්නා වූ යම් මේ පර්වතයක් මෙයින් පෙර දිශාවෙහි පෙනේ ද? ලෝ වැසි තෙමේ මාගේ වාසස්ථානය වූ ඒ පව්ව සමන් කුළ යයි දනී''[8]

''සමන්තකූටවණ්ණනාව'' යන නමෙහි තේරුම සමන්කුළපව්ව පිළිබඳ වර්ණනාව යන්නයි. ඒ අනුව බුදුන් වහන්සේ තෙවෙනි වර ලක්දිවට වැඩම කළ අවස්ථාවේ සමනළ කන්දේ පිහිටුවන ලද සිරි පා සලකුණ පිළිබඳ ව වර්ණනාව මෙහි ඇතුළත් ය. එහෙත් එහි වැඩි ප්‍රමාණයක් ගාථා වෙන් වී ඇත්තේ බුද්ධ චරිතය විස්තර කිරීම සඳහාය. ඒ සඳහා ගාථා 796 න් ගාථා 600 ක් පමණ යොදාගෙන ඇත. බුදුන් තෙවෙනි වර ලක්දිවට වැඩි අවස්ථාවේ සුමන සමන් දිව්‍ය රාජයාගේ දිව්‍යමය වූ ආහාර පාන වළඳා ඔහුට ධර්ම දේශනා කොට ලෝකවාසී සත්ත්වයා කෙරෙහි අනුකම්පාවෙන් පර්වත මුදුනට වැඩම කොට තම පා සලකුණ එහි සටහන් කළ බව මහාවංසයේ ද සඳහන් වේ.[9] සමන්තකූටවණ්ණනාවේ බුද්ධ චරිතය වර්ණනා වන නිසා පොල්වත්තේ බුද්ධදත්ත හිමියන් පෙන්වා දෙන්නේ මෙය බුද්ධචරිත කථාවක් හැටියටය.[10] බුද්ධ චරිතය පිළිබඳ විස්තර වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ ජාතක අටුවා නිදානයේ වන අතර එම ග්‍රන්ථය ද රචනා වී ඇත්තේ අට්ඨකථාවලට පසුවය. එසේම මෙහි අන්තර්ගත තොරතුරු මුල් නිකාය ග්‍රන්ථයන්හි හා මහායාන බෞද්ධ සංස්කෘතියෙහි පිළිගැනෙන බුද්ධ චරිතයට වඩා වෙනස්ය. බුද්ධ චරිතය පිළිබඳ ව විස්තර වන අනෙක් ග්‍රන්ථ වන්නේ ජිනාලංකාර, ජිනචරිත හා ජිනවංස යන කාව්‍යයෝය. මේ කෘති අතරින් ජිනචරිතයේ බුද්ධ චරිතය පිළිබඳ වැඩි විස්තරයක් දැකිය හැකිය. එහෙත්

වර්ණනා චාතුර්ය අතින් සමන්තකූටවණ්ණනාව ප්‍රමුඛස්ථානයෙහි ලා සැලකිය හැකිය."[11]

සමන්තකූටවණ්ණනාව කාව්‍යාත්මක වටිනාකමකින් යුත් ග්‍රන්ථයකි. එය බුද්ධචරිත ග්‍රන්ථයක් වශයෙන් ද, ඓතිහාසික ග්‍රන්ථයක් වශයෙන් ද, ධර්ම ග්‍රන්ථයක් වශයෙන් ද අගය කළ හැකිය. බුද්ධචරිත ග්‍රන්ථයක් වන්නේ තෙවෙනි වර ලක්දිවට වැඩම කරන තෙක් බුදුරජුන්ගේ චරිතය විස්තර වන නිසාය. ඓතිහාසික වශයෙන් වැදගත් වන්නේ සුමන සමන් දිව්‍ය රාජයා පිළිබඳ තොරතුරු, මහියංගන චෛත්‍ය රාජයාගේ ඓතිහාසික සංවර්ධනය, පැරණි ගම් වල නම්, ස්ථාන නාම, පුද්ගල නාම, කඳු හා පර්වත පිළිබඳ තොරතුරු ආදිය පිළිබඳ කරුණු අන්තර්ගත වන නිසාය. බුද්ධත්වයෙන් පසු ප්‍රථම ධර්ම දේශනාව පැවැත්වීම, යසකුල පුත්‍ර, භද්දිය කුමාරවරු ආදීන්ට කරන ලද දේශනාවන් පිළිබඳ තොරතුරු අන්තර්ගතවීම වැනි කරුණු නිසා ධර්ම ග්‍රන්ථයක් වශයෙන් වැදගත් වේ. මෙවැනි තොරතුරු පිළිබඳ ගවේෂණය කරන්නෙකුට සමන්තකූටවණ්ණනාව හිස්ථසාර ග්‍රන්ථයක් වේ. මේ සියලු තොරතුරු සපයන සමන්තකූටවණ්ණනාවේ අන්තර්ගත තොරතුරු මෙසේ සම්පිණ්ඩනය කර දැක්විය හැකිය.

## සමන්තකූටවණ්ණනාවේ අන්තර්ගතය

### සිද්ධාර්ථ චරිතයඃ-

සෑම ග්‍රන්ථයක් ම ආරම්භ වන්නේ තමන් අදහන ආගමට නමස්කාර කිරීමෙනි. ඒ අනුව මෙහි කතුවරයා ද තමන්ගේ ආගමට අනුව තුනුරුවන් වන්දනා කිරීම සඳහා යොදාගෙන ඇති ආරම්භක ගාථා ප්‍රමාණය තුනකි. මෙම ගාථා වර්තමානයේ බොහෝ දෙනා විසින් නමස්කාර ගාථා වශයෙන් ද භාවිත කරනු ලැබේ. ග්‍රන්ථය රචනා කරන්නේ කුමන හේතුවක් නිසාද යන්න පැවසීමට ගාථා තුනක් උපයෝගී කරගෙන තිබේ. එහිදී සමන්කූළ වර්ණනාව සාදර සිතින් යුතුව ඇසිය යුතු බව හා එසේ ඇසීමෙන් ඇතිවන ආනිශංස පිළිබඳ විස්තරයක් මෙහි ඇතුළත් වේ.



මින් අනතුරුව බුද්ධ චරිතයේ සුවිශේෂී අවස්ථාවක් වර්ණනා කිරීම සමන්තකූටවණ්ණනාවේ අරමුණ නිසා ඊට පසුබිම් වූ බෝධිසත්වයන්ගේ කථා පුවතේ සිට සිද්ධාර්ථ චරිත කථාව විස්තර කිරීම ආරම්භ කොට තිබේ. මේ සඳහා ගාථා 129 ක් යොදාගෙන ඇත. ඒ අනුව සිද්ධාර්ථ චරිතයේ සිදු වූ සුවිශේෂී අවස්ථා නිරූපණය කිරීමට ප්‍රථම දස පාරමිතා සම්පූර්ණ කොට තුසිත දිව්‍ය ලෝකයේ උප්පත්තිය ලැබූ බෝසතාණන්ට බුදුවීම සඳහා දෙව් බඹුන් විසින් ආරාධනා කිරීම 7-10 ගාථාවලින් දක්වා ඇත. පස්මහ බැලුම් බැලීම, කිඹුල්වත් පුර වර්ණනාව, සුද්ධෝදන හා මහාමායා දේවි වර්ණනා කිරීම, සිහින දකිමින් මව්කුස පිළිසිඳ ගැනීම, දස එකඩ මසක් ඇවෑමෙන් මහාමායා දේවිය දෙව්දහ නුවරට යාමට පිටත් වීම, අතරමග ලුම්බිනි සල් උයනේ දී සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය හා පියුම් හතක් මතුපිට ඇවිද ගොස් අභීත සිංහනාදය පැවැත්වීම 11-37 ගාථාවලින් වර්ණිතය. කුඩාකල කෙළි දෙලෙන් පසුවීම, සොළොස් වියට පා තැබූ අවස්ථාවේ කුමරුන් ශිල්ප දැක්වීම, සරණ මංගල්‍යය, යශෝධරා දේවිය වර්ණනා කිරීම හා රාජශ්‍රිය අනුභව කිරීම 38-53 ගාථාවලින් විස්තර වේ. රජ මාලිගයෙන් පිටතට ගොස් උද්‍යාන ක්‍රීඩාවේ නිරතවීම, උයන් කෙළි සඳහා ගමන් ගන්නා අවස්ථාවේ සතර පෙරනිමිති දැකීම, මාලිගයට පැමිණෙන කුමරුන්ගේ දේහ විලාසය හා ශ්‍රී සම්පත්තිය දුටු කිසාගෝතමිය නිබ්බුත පද කීම, ඇසළ පුන් පොහෝ දින රාහුල කුමාරුන්ගේ උත්පත්තිය සිදුවීම, මාලිගාවේ සිටි නළඟනන්ගේ නැටුම් හා ඔවුන් රාත්‍රියේ නිදාගෙන සිටි විප්‍රකාර ස්වභාවය දැක සසර කළකිරීම, මහා අභිනිෂ්ක්‍රමණය පිණිස කන්ථක අසු හා ඡන්න ඇමතියා සමග යාම වැනි තොරතුරු ගෙනහැර දක්වන්නේ කථාන්දරයක ස්වරූපයෙනි. ඉන්පසු දෙව් බඹුන්ගේ ආරක්‍ෂාව හා පුද සත්කාර මැද අනෝමා ගංතෙර දක්වා පැමිණීම, තමන් පැළඳගෙන සිටි කසී සළු ඉවත් කොට පැවිදි වෙස් ගැනීම, කෙස් වැටිය කපා උඩට විසිකොට බුදුබව ප්‍රාර්ථනා කිරීම හා එම කෙස් සක් දෙව් රජුන් දෝතින් ගෙන මැණික් සෑයක් සාදා එහි තැන්පත් කිරීම ආදි විස්තර 54-98 ගාථාවලින් වර්ණිතය.

ඝටීකාර මහා බ්‍රහ්මයා විසින් කරන ලද අටපිරිකර පූජාව හා එම කසාවත් පෙරවීම, කසී සළු බඹලොවට ගෙනගොස් සෑයක්



16 JUL 201

බැඳීම, අඹ උයනේ සත් දිනක් විවේක සුවයෙන් සිටීම, දෙතිස් මහා පුරුෂ ලක්ෂණයෙන් හා අසූ අනුව්‍යංජනයෙන් හොබවමින් රජගහ නුවරට සම්ප්‍රාප්ත වීම යන කරුණු 99-105 ගාථාවල අඩංගුය. 106-125 ගාථාවලින් විස්තර වන්නේ මුන්වහනසේ දුටු රජගහ නුවර වැසියෝ "මේ චන්ද්‍රයාය, සූර්යයාය, අණංගයාය, විෂ්ණුය, ශක්‍රයාය, බ්‍රහ්මයාය, නැතහොත් පාරමී දම් පිරූ මහෝත්තමයෙක්" යැයි තර්ක විතර්ක කිරීමය. 126-133 ගාථාවල ප්‍රථම වරට පිඬු සිඟා ගොස් ලත් ආහාරය පාණ්ඩව පර්වත පාමුල හිඳ වළඳා විවේක ගෙන බිම්සර රජුට ප්‍රතිඥා දී උරුවෙල් දනව්වට ගොස් සය අවුරුද්දක් තිස්සේ දුෂ්කර ක්‍රියාව කිරීම පිළිබඳ තොරතුරු අන්තර්ගතය. 134-156 ගාථාවලින් මධ්‍යම ප්‍රතිපදාවෙන් යුක්තව වැඩසිටිනා අවස්ථාවේ සුජාතා සිටු දියණිය පැමිණ කිරිපිඬු පූජා කිරීම, සොත්ථිය බමුණා විසින් පිළිගන්වන ලද කුසතණ අට මිටක් කොට බෝ මුල අතුරා වැඩ සිටීම, එවිට පොළොව පලාගෙන නැගී තුදුස්රියන් පමණ වූ වජ්‍රාසනය දැක මාගේ ඇට, මස්, ලේ, නහර ආදිය වියලී ගියත් බුදු වී මිසක නො නැගිටිමි යන උදාරතර අධිෂ්ඨානයෙන් යුක්තව ඒ වජ්‍රාසනය මත බෝ රුකට පිට දී වැඩ හිඳීම විස්තර කෙරේ.

දස දහසක් ලෝක ධාතුවෙහි සිටින්නා වූ දේව, බ්‍රහ්ම, නාග, සිද්ධ විජ්ජාධර ආදි නොයෙක් සත්ත්වයින් බෝ මැඩට අවුත් සිද්ධාර්ථ තවුසාට පූජා සත්කාර කළ ආකාරය පිළබඳ තොරතුරු 157-197 විස්තර වේ. මෙහිදී නොයෙක් බඹ සුර අසුර ආදීන්ගේ නාමලේඛනයක් ඉදිරිපත් කර ඇති ආකාරය ද දැකිය හැකිය. මේ ගාථා අතර ඇති එක් ගාථාවක සඳහන් වන්නේ ශක්‍ර දේවේන්ද්‍රයාගේ වීණා වාදකයා වූ පඤ්චසිඛ ද මෙතැනට පැමිණ වීණා වාදනය කළ බවය.[12] ඔහු සිද්ධාර්ථ තවුසා බුද්ධත්වයට පත් වූ පසු ද බුදුරජුන්ගේ සමීපයට පැමිණ වීණා වාදනය කළ කෙනෙකි.[13] එසේ ම නොයෙක් දෙවියන්, දිව්‍යාංගනාවන් ආකාශයේ ඉහළින් පැමිණ ගායනා කරමින් මල් විසුරුවා සිද්ධාර්ථ තවුසාට ආශිර්වාද කළ අයුරු ද විස්තර වේ. එසේ විසුරුවන ලද මල් සිද්ධාර්ථ තවුසා සිටි බෝ රුක ඉහළින් වියනක් සේ පිහිටි බව සඳහන් වේ.[14]

198-392 දක්වා ගාථා 200 කින් පමණ විස්තර වන්නේ මාර පරාජය හා බුද්ධත්වය අවබෝධ කර ගැනීම පිළිබඳ කථා පුවතයි.



වසවර්ති මාරයා අනෙකුත් මාර සේනාව සමග සිද්ධාර්ථ තවුසා වෙත පැමිණ එතුමන් විනාශ කර දැමීම සඳහා කුමන්ත්‍රණ කිරීම මෙම ගාථා තුළ අන්තර්ගත වී ඇත. එහි දී සුළඟ, වැස්ස, ගිනි අඟුරු, ගල්, ආයුධ, උණු අළු, උණු වැලි, උණු මඩ, ඝනාන්ධකාරය, චක්‍රායුධය ආදි නොයෙක් ආයුධවලින් දමා ගැසීම මෙන් ම නන් වෙස් ගෙන බිය වැද්දීම ආදි එකොළොස් ආකාර කුමන්ත්‍රණ පිළිබඳ තොරතුරු අන්තර්ගතය. මේ එකොළොස් ආකාර වූ ආයුධ රැගෙන එන ලද්දේ එක් එක් මාරයා විසිනි. ඒ සියලු දෙනාගේ ක්‍රියාකාරකම් පිළිබඳ ව වෙන වෙන ම විස්තර කර ඇති අයුරු දැකගත හැකිය. මේ සියල්ලකට ම සාර්ථක ව මුහුණ දුන් සිද්ධාර්ථ තවුසා ඒ මර සේනාව විද්වංසනය කිරීම වර්ණනා කරන්නේ සිත් ගන්නා සුළු ආකාරයෙනි. "මාරවිජය කථා" නමින් වර්ණනා කර ඇති සෑම කථා පුවතක් අවසානයේ ම මාරයාට පවසන්නේ තමා නරපුරුෂයන් දමනය කරන තැනැත්තෙක් නිසා තමන්ට වඳින පුදන ලෙසය. එහෙයින් ම ඔහුට පිහිට වූයේ යැයි ද ප්‍රකාශ කර තිබේ. එකොළොස් ආයුධයන්ගෙන් පරාජයට පත් කරන්නට නොහැකි වූ මාරයා අවසානයේ පවසන්නේ "නුඹ සිටින පර්යංකය මා සතුය. එබැවින් ඔතනින් ඉවත්වන ලෙසය."[15] මින් පසු දෙදෙනා අතර සංවාදයක් ඇති වේ.

> "මේ පර්යංකය ලබා ගැනීමට පාරමී දම් පිරිය යුතුය. ශීර්ෂාදි දානයෝ කළයුතුය. ඔබගේ සාක්ෂිකරුවෝ කවරහුද?"[16]
>
> මෙසේ කී විට මාරයා පවසන්නේ "තාපසය, මේ මාගේ සියලු පිරිස ඊට සාක්ෂිය"[17] යනුවෙනි.

ඉන්පසු එක් එක් මාර සේනාව විසින් "මම සාක්ෂි වෙමි" මම සාක්ෂි වෙමියි" පවසනවාත් සමග පොළව පැලීම සිදුවිය. මෙය දුටු මාරයා ඔබ මේ පර්යංකය සඳහා දානාදි පාරමිතාවන් පිරුවේ නම් ඊට සාක්ෂි මොනවාදැයි ඇසීය. එවිට තවුසා තමන්ට සචේතනික දෙයක් නොමැති බවත් අචේතනික මහ පොළොව ඊට සාක්ෂි යැයි කියා "ජාති ජාතිත් තමා විසින් කරන ලද දානාදි පාරමිතාවන්හි දී කම්පා වූ මහ පොළොව අද කම්පා නොවන්නේ කුමක් නිසාදැයි" විමසනවාත් සමග මහී කාන්තාව අවුත් ඊට සාක්ෂි දැරුවාය.[18] මේ ආශ්චර්යය දුටු මාරයා හා මාර සේනාව හිස් ලූ ලූ අත දිවූහ. මෙම

කථා පුවත වර්ණනා කර ඇති ආකාරය අනුව කියවන පාඨකයාගේ සිත් තුළ ඇඳෙන්නේ නාට්‍යයක අවස්ථාවකි. දෙදෙනා අතර සංවාදාත්මක ආකාරයෙන් විස්තර වී ඇති කථා පුවත තුළ මාරයා කෙතරම් බිහිසුණු කෙනෙකු ලෙස හැසිරුණත් සිද්ධාර්ථ තවුසා තුළ තිබුණු නිවුණු බව, කුළුණුබර ස්වභාවය හා අවිහිංසාව පිළිබඳ කියවන විට ඇති වන්නේ අද්භූත, ආශ්චර්ය මෙන් ම ශාන්ත රසයකි.

## බුද්ධ චරිතයේ ආරම්භක අවස්ථාව

මාර පරාජයෙන් පසු අස්වත්ථ බෝධිද්‍රුමරාජයන් මූලයේ දී පුබ්බේනිවාසානුස්සති, චුතූපපාත හා ආසවක්ඛය යන ත්‍රිවිද්‍යාවන්හි අවබෝධයෙන් ලොවුතුරා සම්‍යක් සම්බෝධියට පත්වීම හා ''අනේක ජාති සංසාරං'' ආදි ගාථාවෙන් අභීත සිංහනාද පැවැත්වීම වර්ණනා කර ඇත. ඉන්පසු බෝධිමූල වජ්‍රාසනයේ වැඩ සිටිමින් තමන් විසින් අවබෝධ කරගත් ධර්ම මෙනෙහි කරමින් වැඩ සිටීම, අනිමිස ලෝචන පූජාවෙන් බුද්ධත්වය සඳහා පිහිට වූ බෝ රුක දෙස සතියක් බලා සිටීම, බෝ මැඩටත් අනිමිස ලෝචන පූජාව පැවැත් වූ ස්ථානයටත් අතරමැද දෙවියන් විසින් මවන ලද රුවන් සක්මණෙහි සක්මන් කිරීම, බෝ මැඩට වයඹ දෙසින් දෙවියන් මැවූ රුවන් ගෙයි වැඩ හිඳිමින් ධර්මය මෙනෙහි කිරීම, අජපාල නුගරුක මුල වැඩ හිඳිමින් කාම නමැති දැලෙහි පටලවා ගැනීමට උත්සහ කළ තණ්හා, රතී, රඟා යන මාර දූවරුන් විසින් කරන ලද අනඟ රැඟුම් කෙරෙහි අශාවක් නූපදවා ඔවුන් දමනය කිරීම, (මෙහිදී එක් එක් මරඟණ සමග සංවාදාත්මක ස්වරූපයෙන් ඔවුන්ට කරුණු අවබෝධ කරදීම සිදු කොට ඇත.)[19] මිදෙල්ල රුක් මුල වැඩ සිටි බුදුරජුන් වැස්සෙන් ආරක්ෂා කිරීම සඳහා පැමිණි මුදලිඳු නා රජුගේ පූජෝපහාරයන් ලැබීම, කිරිපළු නුග රුක මුල වැඩ සිටීම යන සත් සතිය ගත කළ ආකාරය මේ ගාථාවන්ගෙන් වර්ණිතය. මෙම විස්තර සපයාගෙන ඇත්තේ පශ්චාත්කාලීන අටුවා, වංසකථා ආදීන්ගේ එන තොරතුරු ආශ්‍රයෙනි. මුල් බුදුසමයට අනුව බුදුරජුන් සත්සතියක් ගතකළ බවට තොරතුරු හමු නොවේ. ත්‍රිපිටකයේ අන්තර්ගත වී ඇත්තේ බෝ මුල වැඩ සිටීම, අජපාල නුගරුක මුල වැඩ සිටීම, මුචලින්ද නාග දරණයෙහි වැඩ සිටීම හා රාජායතනයෙහි වැඩ සිටීම යන අවස්ථා හතර පමණි.[20] ඒ අනුව සමන්තකුටවණ්ණනාව රචනා කිරීමේදී බොහෝ



සෙයින් පශ්චාත්කාලීන කෘති පරිශීලනය කර ඇති බව මෙයින් පැහැදිලි වේ.

සුජාතා සිටු දියණිය විසින් බෝධි සත්ත්වයන් වහන්සේට පිළිගැන් වූ කිරපිඬු, හතළිස් නව පිඬක් කොට වැළඳූ පසු කිසිදු ආහාරයක් ගත් බවක් සඳහන් නොවේ. ආහාර කිසෙන් තොරව සිටි බව සමන්තකුටවණ්ණනාවේ ද සඳහන් කර ඇත. ''ආහාර කෘත්‍යාදියෙන් තොර වූ විමුක්ති සුවය පමණක් අනුභව කරමින් පිණා ගිය ශරීර අවයවයන්ගෙන් සමන්විත සර්වඥයන් වහන්සේ සත් සතියක් ගත කළහ.''[21] ඒ අනුව බුද්ධත්වය අවබෝධ කිරීමෙන් පසු උන්වහන්සේට ප්‍රථම දානය පිළිගැන්වූයේ තපස්සු හල්ලුක යන දෙසොහොයුරන් බව කියැවේ.[22] දන් පිළිගන්වා අවසානයේ බුදුන් ගෙන් දහම් අසා ප්‍රථමයෙන් බුදුන් හා දහම් සරණ ගිය ද්වේවාචික (බුදුන් දහම් පමණක් සරණ ගිය බැවින් මේ නම යෙදේ) උපාසකවරු දෙදෙනා වූහ. වැඳුම් පිඳුම් කිරීම සඳහා යමක් ඉල්ලූ විට හිස පිරිමැද මොවුන්ට දුන් කේස ධාතුන් වහන්සේලා රැගෙනවිත් ත්‍රිකුණාමලයේ තිරියාය ගමේ පර්වතයක් මුදුනේ සෑයක් බැඳ එහි තැන්පත් කරන ලදි. එය පසුකලෙක ගිරිහඬු සෑය නමින් හඳුන්වා ඇත. මේ කතා පුවත වර්ණනා කිරීම සඳහා ගාථා හයක් උපයෝගී කරගෙන ඇත.

මනුෂ්‍යත්වයේ අග්‍ර ඵලය වන බුද්ධත්වය අවබෝධ කිරීමෙන් පසු තමන් අවබෝධ කරගත් ධර්මය නැවත නැවතත් මෙනෙහි කළ උන්වහන්සේට වැටහුණේ ''මේ ධර්මය ඉතා ගැඹුරුය, රාග, ද්වේශ ආදීන්ගෙන් යුත් ප්‍රජාවට චතුරාර්ය සත්‍යය ධර්මය දේශනා කරන විට ඔවුන් තේරුම් නොගතහොත් මට වෙහෙසත්, ක්ලාන්තියත් ඇතිවිය හැකිය. උඩුගම් බලා යා යුතු මේ ගමන දුකසේ දැකිය යුතුය. එහෙත් අවිද්‍යාස්කන්ධයෙන් වැසුනා වූ ප්‍රජාව මෙය නොදක්නාහුය.''[23] යනු වෙනි. මේ සිතිවිල්ල පහළ වෙනවාත් සමග සහම්පති මහා බ්‍රහ්මයා බුදුරජුන් වෙත පැමිණ දහම් දෙසන්නට ආරාධනා කිරීම, ධර්මය දේශනා කළ යුත්තේ කවුරුන්හට දැයි විමසා බැලීම, ආලාර කාලාම හා උද්දකරාමපුත්ත මියගොස් ඇති බව දිව නැණින් දැකීම, කොණ්ඩඤ්ඤ ආදි පස්වග මහණුන් ඉසිපතනයේ ඇති බව දැන එහි වැඩම කිරීම, පස්වග මහණුන් ඇතුලු අට කෙළක් බ්‍රහ්මයින්ට හා අසූ කෙළක් දෙවියන්ට ධර්මය දේශනා කිරීම හා වස් කාලය එළඹ ඇති

බැවින් ඉසිපතනාරාමයේ ම වස් විසීම, යස කුල පුත්‍රයා ඇතුළු පණස් හතර දෙනෙක් යහළුවන් පැවිදි කරවීම, ප්‍රථම රහත් හැටනම ධර්මදූත මෙහෙවරෙහි යෙදවීමෙන් ප්‍රථම ධර්ම දූත පිරිස ආරම්භ කිරීම, තමන් වහන්සේ උරුවෙල් දනව්වට වඩින අවස්ථාවේ භද්දවග්ගිය කුමාර වරුන්ට දහම් දෙසීම යන තොරතුරු මෙහි අන්තර්ගතය. මෙම විස්තර ඉදිරිපත් කිරීම සඳහා ගාථා තිහක් යොදාගෙන ඇත.

**බුදුරජුන්ගේ ලංකාගමන්:-**

සමන්තකූටවණ්ණනාවේ විස්තර වන අන්දමට බුදුරජුන් උතුරු කුරු දිවයිනට පිඬු පිණිස වැඩම කොට මනරම් දිය දහරින් යුත් හිමාල ප්‍රදේශයේ අනෝතත්ත නම් විල් තෙරට පැමිණ පිණ්ඩපා තය වළඳා අවසානයේ "මම ජීවමානව වැඩ සිටින්නේ ටික කාලයකි. අනාගතයෙහි මාගේ ශාසනය පවතින්නේ ලක්දිවය. එහෙත් දැන් එහි යක්ෂ උවදුරු ඇති හෙයින් එය දුරු කළ යුතුය." යනුවෙන් සිතා ලක්දිවට පැමිණීම සඳහා පිටත් වූ අයුරු විස්තර කෙරේ. මේ සිදුවීම සිදු වූයේ බුද්ධත්වයෙන් නම වෙනි මාසයේ දීය. එසේ ලක්දිවට වැඩම කොට ලග්ගල, ලොග්ගල, කරඹගල, යක්දෙස්සාගල, දිඹුලාගල, කුරගල, මාරගල, මිහින්තලාගල, රිටිගල, පූතිජලගල, (කුණුදිය පර්වතය) බලගල, මහමුහුණුගල, යහන්ගල, තුන්කුළුගල යන ස්ථානය න්හි සිටි යක්ෂයෝ ඔවුනොවුන් භේද භින්න වී රොස් පරොස් බස් කියමින් සංග්‍රාමයට අවුත් බින්තැන්නේ වූ (මහියංගන ප්‍රදේශය) මහා නාග වනයට රැස් වූහ. මේ අවස්ථාවේ ඔවුන්ට අනුකම්පා කළ බුදුරජුහු ප්‍රථමයෙන් වැස්ස, අඳුර, වාත, සීත යන සිව් භූතයන් මවා භය ගන්වා නැවත අභය දානය දී අහසින් බැස එලසමවතට සමවැදී ගිනිදැල් විහිද වූහ. එයින් බියට පත් වූ යක්ෂ සේනාව ඒ මේ අත දුවමින් ගිරි දිවයිනට පළවා හැර දිව්‍ය බ්‍රහ්ම ආදීන්ට දහම් දෙසූ පුවත ආදිය විස්තර කිරීම සඳහා ගාථා තිස් හතක් යෝජනා කර තිබේ.

දහම් ඇසූ සුමන දිව්‍ය රාජයා සෝවාන් ඵලයට පත් වූ පුවත ද මෙහි ඇතුළත්ය. ඒ අනුව ලක්දිව දී ප්‍රථමයෙන් ආර්ය ශ්‍රාවක තත්ත්වයට පත් වූ තැනැත්තා සුමන සමන් දිව්‍ය රාජයාය. ඔහු බුදුන්ගෙන් ලබාගත් කේසධාතු නිධන් කොට සත්රියන් මිණි සෑයක් කළ පුවත හා එම සෑය පසුකාලීනව සරභූ මහ රහතන් වහන්සේ



විසින් බුදුරජුන්ගේ චිතකයෙන් ලබාගත් ග්‍රීවා ධාතුව තැන්පත් කොට දොළොස් රියන් කොට සෑද වූ පුවත විස්තර කෙරේ. චූලාභය රජු රියන් 32ක් හා දුටු අබා රජු 64 රියන් කොට එය තැන වූ අයුරු තවදුරටත් විස්තර වේ.

ප්‍රථම ලංකාගමනයේදී සිදු කළ යක්ෂ දමනයෙන් පසු උන්වහන්සේ නැවතත් උරුවෙල් දනව්වට වැඩමකොට තුන් බෑ ජටිලයන් තුන්දහස් පන්සියයක් දෙනාට දහම් ඇස ලබා දී නිවන් අවබෝධ කරවීම කෙටියෙන් දක්වා ඇත. ඉන්පසු රජගහ නුවරට වැඩම කොට බිම්බිසාර රජුට දහම් දෙසා එතුමන් විසින් කරවන ලද වේළුවනාරාමයේ දෙවෙනි තුන්වෙනි හා සිව්වැනි වස් එහි වාසය කොට එම ප්‍රදේශයේ බොහෝ දෙනාට දහම් අවබෝධ කරදුන් අයුරු ගාථා හයකින් විස්තර කෙරේ. එසේ ම පස්වෙනි වස විසීම සඳහා සැවැත් නුවර තෝරාගත් අයුරු 552 වෙනි ගාථාවෙන් විස්තර වේ.

බුදුරජුන්ගේ දිනචරියාවෙහි එක් අංගයක් වන්නේ අළුයම් වේලෙහි ලොව බලා කාට හෝ පිහිට වීමය. ඒ අනුව පස්වෙනි වස නිමවා සිටි උන්වහන්සේ දුටුයේ ලක්දිව නාග ගෝත්‍රික දෙසොහෝ යුරන් වූ චූලෝදර (කුඩා උදරයක් ඇති) හා මහෝදර (මහත් වූ බඩක් ඇති) අතර ඇති වන්නට ගිය යුද්ධයයි. එතැනට තමන් වහන්සේ වැඩියේ නම් බොහෝ දෙනෙකුට සෙත සැලසෙන බව දැක සමිද්ධි සුමන දිව්‍ය රාජයා විසින් උදුරා ගන්නා ලද කිරිපළු රුක සේසත් කොටගෙන නක දිවයිනට (යාපනය) වැඩිසේක. කැලණියේ රජකළ මණි අක්ඛික නා රජ යුද පිණිස නක දිවයිනට අවුත් සිටියේය. බුදුරජාණන් වහන්සේ ද ශෝභාමත්ව අහස් ගැබ තුළ වැඩ සිටියහ. උන්වහන්සේගේ ශරීර ශෝභාව හා අනුහස් දැක මණිඅක් නා රජ තෙරුවන් සරණ ගිය උපාසකයෙක් බවට පත්විය. යුද්ධය එයින් ම නතර විය. ඉන්පසු බුදුරජුන්ට තමන්ගේ රාජ්‍යය වන කැලණියට වඩින ලෙස ආරාධනාවක් ද කළේය. ඒ අනුව උන්වහන්සේ නැවත දඹදිවට වැඩමකොට සත්වෙනි වර්ෂයේ දී මාතෘ දිව්‍ය පුත්‍රයා ඇතුළු දෙවියන්ට විජම් (අභිධර්ම) දේශනාව පැවැත්වීය. අටවෙනි වර්ෂයේ දී උන්වහන්සේ දෙව්රම් වෙහෙරේ වස් විසූ බව ද සමන්තකූට වණ්ණ නාවේ සඳහන් වේ.

සැවැත් නුවර ජේතවනාරාමය කරවූයේ අනේපිඬු සිටුතුමාය. එම දෙව්රම් වෙහෙර හා සැවැත් නුවර වර්ණනා කිරීම සඳහා ද සමන්තකූටවණ්ණනාවේ ගාථා විස්සක් පමණ වෙන් වී ඇත. එහිදී සැවැත් නුවර මහත් භෝග සම්පත්තියෙන් අනූන වූ නගරයක් ලෙස දක්වා ඇත. එහි ඇති දෙව්රම් වෙහෙර නොයෙක් සිය ගණන් ශිල්පීන් විසින් කරවන ලද්දක් බව දක්වා ඇති අතර නොයෙක් දිශාවන්ගෙන් පැමිණෙන රහතන් වහන්සේලාගෙන් අතොරක් නැති බව ද විස්තර කරයි. එසේම දෙව්රම් වෙහෙර මළුව ද අවට පරිසරය දොඹ, බක් මී, කුඹුක්, ඇසළ, නා, මී අඹ, සපු ආදි නොයෙක් වෘක්ෂයන්ගෙන් සමන්විත මනරම් පරිසරයක් බව ද, දෙව්, බඹ, අසුර, නර, උරග, සෘෂි, සිද්ධ විද්‍යාධර ආදි දිව්‍ය ජන සමූහයාගෙන් ගැවසීගත් ස්ථානයක් ලෙස ද මහත් අභිරුචියෙන් හා ගෞරවයෙන් යුක්තව වර්ණනා කර ඇති අයුරු මේ ගාථාවලින් දැකිය හැකිය. මෙකී වර්ණනාව කරන විට එය මිහිකතගේ හිස මත පිහිටි රන් රුවනින් අලංකාර වූ විශාල කිරුලක් මෙන් ද, ශ්‍රියා කාන්තාවට පොළෝ තලයෙහි වාසස්ථානය සඳහා ඉදි වූ සක් දෙව් රජුන්ගේ අමරාවතී නගරය මෙන් ද, කුවේර රාජයාගේ වාසස්ථානය වූ ආලක මන්දාව මෙන් ද බබළන බව පෙන්වා දී තිබේ.[24] මෙම කථාපුවත් විස්තර කිරීම සඳහා ගාථා 63 ක් යොදාගෙන ඇත.

සමන්තකූටවණ්ණනාව රචනා කිරීමේ ප්‍රධානතම මාතෘකාව වූ තෙවෙනි ලංකාගමන අවස්ථාවේ සිදු වූ ශ්‍රී පාදය පිහිටුවීම යන පුවත ගෙනහැර දක්වන්නේ මින් පසුවය. දෙවෙනි ලංකාගමනයේ දී මණිඅක්ඛික නා රජුගේ ආරධනාව කුළුණින් පිළිගත් බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් අටවෙනි වර්ෂයේ දී නැවත ලක්දිවට වැඩම කිරීමට තීරණය කළහ. මණිඅක් නා රජු බුදුරජුන් ප්‍රධාන පන්සියයක් රහතන් වහන්සේලාට වැඩ සිටීම සඳහා මනරම් මන්දිරයක් ඉදිකළ බව කියවේ. මේ ගමනට සාරිපුත්ත, මොග්ගල්ලායන, මහාකාශ්‍යප, උපාලි, අනුරුද්ධ, උපවාන, බක්කුල, අංගුලිමාල, රාහුල, භද්දිය, කොණ්ඩඤ්ඤ, අස්සජි, සීවලී, කුමාර කාශ්‍යප, පුණ්ණ, සොණ, සොභිත, රේවත, වංගීස, නන්ද, භාරද්වාජ, යනාදී ප්‍රමුඛ පෙළේ රහතන් වහන්සේලා වැඩි බව සමන්තකූටවණ්ණනාවේ විස්තර වේ.[25] උන්වහන්සේ රහතුන් සමග අහසින් වඩින අවස්ථාවේ දෙව්, බඹ,



අසුර ආදින් වැඳුම් පිදුම් කළ බවත් ඔවුන්ට නොයෙක් ආකාරයෙන් දම් දෙසා පෙළහර පෑ තොරතුරුත් මෙහි අන්තර්ගතය. ලක්දිවට වැඩි උන්වහන්සේ කැලණි තොටෙන් නා පිරිසිදු වී මල් අතුරා කරන ලද මණ්ඩපයෙහි වැඩ හිඳ දන් වළඳා නා රජුන් ප්‍රධාන නාග ගෝත්‍රික යන්ට දම් දෙසා ඔවුන්ගේ පූජා සත්කාර ලබමින් වැඩ සිටි සේක. මේ අවස්ථාවේ සමනළ ගලින් පැමිණ සිටි සුමන සමන් දිව්‍ය රාජයා බුදුරජාණන් වහන්සේ සමීපයට පැමිණ ඇදිලි බැඳ "ස්වාමීනි භාග්‍ය වතුන් වහන්ස, සකල ලෝකයාට ම හිත වැඩ පිණිස පහළ වූ ඔබ වහන්සේ නයින්ට වැඩ පිණිස මෙහි පැමිණියා සේම අපටත් වැඩ පිණිස ලංකාංගනාවගේ මුදුන් මල්කඩක් බඳු වූ මෙයින් පෙර දිශා වෙන් පෙනෙන සමන්තකූට පර්වතයට වැඩ මාගේ භවනයෙහි ඔබ වහන්සේගේ ශ්‍රී පාද රශ්මියෙන් අතිශයින් පවිත්‍ර වූ පා සටහනක් කළ මැනව" යි ආරාධනා කළේය.[26] මෙම දීර්ඝ විස්තරය සඳහා ගාථා 160 ක් යොදාගෙන තිබීම විශේෂත්වයකි. ග්‍රන්ථයෙහි ප්‍රධාන අරමුණ වන ශ්‍රී පාදය සනිටුහන් කිරීම යන කථා පුවතට පසුබිම් වූ සිදුවීම් විස්තර කිරීම සඳහා මෙපමණ ගාථා ප්‍රමාණයක් ගෙනහැර දැක්වීම උචිතය.

**සමන්තකූට වර්ණනාවඃ-**

සමන්තකූටවණ්ණනාවෙහි ප්‍රධාන අරමුණ වන සමන්කුළු පව් වැණුම ආරම්භ වන්නේ මෙතැන් පටන්ය. නිල්වන් වූ ඝන වනාන්තරයෙන් යුත්, මහවැලි, කැලණි, වළවේ, කළු යන සිව් මහා ගංගා සඳහා ජල ධාරාවක් වූ මේ වනාන්තරය අවට පර්වත පිරිවරා සිටින්නේ රජු පිරිවරා සිටින ඇමති සමූහයා මෙන් ය. මහවැලි නදිය වර්ණනාව හා අවට පරිසර වර්ණනාව සඳහා යොදාගෙන ඇති අලංකාරය සිත් ඇද ගන්නා සුළුය.

> "ලංකාංගනාවගේ උර තලයෙහි බබලන විශාල මුතුහරක් වැනි සිහිල් දිය දහරින් පිරුණු ජනයාගේ නෙත් සිත් පැහැර ගන්නා වූ අතිශයින් සිත්කළු වූ ලංකා තලය මත පිහිටියා වූ මහවැලි නදියත්, ඒ මහවැලි නදිය ආසන්නයෙහි රමණීය පෙදෙසක දිගින් තුන් යොදුනක් හා පළලින් සිව් ගව්වක් පමණ ස්ථාන යෙහි නෙත් අලවන දිය පාරවල් හා මත් වූ බමර සමූහයාගේ

හා පක්ෂීන්ගේ ගීතමය නාදයෙන් විචිත්‍ර වූ මහාමේඝවන නම් වනයක් විය''[27]

මෙහි කියවෙන අන්දමට මනාකොට පිපුණා වූ පුෂ්ප රාශියෙන් යුත් මේ පර්වතය අවට නොයෙක් භෘංග සමූහයාගෙන් ගැවසී ගත් ස්ථානයක් වශයෙන් ද හඳුන්වා ඇත. කකුළු. කැසුබු, මැඩි, කොක්, හංස, විල්ලිහිණි ආදි ජලචර සතුන් ද මෘග, දිවි, ගෝණ, ඉත්තෑ, හාවුන්, හිවලුන්, ඌරු, එණිමෘග (මුවන්ගෙන් අනර්ඝ වූ මුව විශේෂයකි), හුන හපුළු, වඳුරු, ගව, මහිෂ ආදි වනචර සතුන්ගෙන් ද ගැවසී ගත් මේ පව්ව අලංකාරවත් ලෙස බබළන බව ද විස්තර කෙරේ. වනය තුළ අරළු, මී, නුග, ලුණුවරණ, බෝ, කොලොම්, බක් මී, කොස්, නෙල්ලි, පළොල්, බුළු, සියඹලා, දෙල්, කුඹුක්, පුවක්, හොර, තිඹිරි, දිඹුල්, අඹ, සල්, සපු, කිතුල්, නා, මිදෙල්ල, කොබොලීල, ඇටඹ, කොහොඹ, නාරං, ඇට කෙසෙල්, උක්, වදකහ, ලබු, ආදි ගස් කොළන්වල නාම ලේඛනයක් ද මෙහි දක්වා ඇති අතර එයින් වනස් පති (විශාල ගස්) වෘක්ෂවලට අධිගෘහිත දෙවි දේවතාවුන් ද නිතර ගැවසී සිටින බව දක්වයි.

අනතුරුව විස්තර කරන්නේ බුදුරජුන්ගේ ශ්‍රී පාදය පිළිබඳ ය. උන්වහන්සේ උපන් වේලාවෙහි දෙපතුලෙන් සත් පියුම් පිට ඇවිදීම, කාලදේවල (අසිත) තවුසාගේ හිස මතුපිට දෙපතුල් පිහිටීම, සිය පියරජු එතුමාගේ දෙපතුල් හිස තබා සතුටු කඳුළු වැගිරීම, රුවන් සුක්මන් කෙළවර මේරු පර්වතය නැමී ඒ දෙපතුල් පිළිගැනීම, පිරිහී ගිය ආයුෂ ඇති සක් දෙවිඳුට ඒ දෙපතුල් වැඳීමෙන් දෙව්ලොව පරමායුෂ ලැබීය යන ආශ්චර්ය වැනි සිද්ධි විස්තර කරයි. නර්මදා නදිය මුහුදට ගලා බසින තැන පිහිට වූ ශ්‍රී පාදය, සච්චක තවුසාගේ ආරාධනයෙන් සච්චබද්ධ පර්වතයෙහි සිරිපා සටහන් පිහිටුවීම හා යෝනක දේශයේ ශ්‍රී පාදය පිහිටුවීම සිදු කළාක් මෙන් ශ්‍රී පාදස්ථානයෙහි ද සිරිපා ලකුණ පිහිටුවන ලෙස සුමන සමන් දිව්‍ය රාජයා බුදුරජුන්ට ආරාධනා කිරීම ද මෙහි විස්තර වේ. එම ආරාධන ය පිළිගත් ලෝකස්වාමී වූ බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් අට වෙනි වර්ෂයේ දී වෙසක් පුණු පොහෝ දින මහරහතුන් හා දෙවියන් සහිත ලෝකයා වන්දනාමාන කරද්දී සමන්තකූට පර්වතයෙහි සිරිපා සලකුණ පිහිටුවීම දක්වයි. ඒ අවස්ථාවේ දී අකාල මේඝ හා රන්



රුවන් මල්දම් වැසි වැස්ස වූ ආකාරය ද වර්ණිතය. ඉන්පසු බුදු රජාණන් වහන්සේ දිවා විහරණය සඳහා භගවා ගුහා (දිවාගුහාව) නමින් හැඳින්වෙන ස්ථානයට වැඩිසේක. මෙකී විස්තරය ගෙනහැර දක්වන්නේ ගාථා 83 ක් වැනි කෙටි සංඛ්‍යාවකිනි.

ඒ අනුව ඉහතින් සඳහන් කරන්නට යෙදුන සමන්තකූට වණ්ණනාවේ ගාථා 796 න් ගාථා 600 ක් පමණ යොදාගෙන ඇත්තේ බුද්ධ චරිතය විස්තර කිරීම සඳහා බව පෙනේ. මේ නිසා සමන්තකූට-වණ්ණනාව කියවන පාඨකයා තුළ ඇති වන්නේ මෙය බුද්ධ චරිත කථාවක් යන හැඟීමය. පා ලකුණ පිහිටුවීම බුද්ධ චරිතයේ එක් අවස්ථාවක් වුවත් බුද්ධ චරිතය විස්තර කිරීම සඳහා මෙපමණ ගාථා සංඛ්‍යාවක් යොදාගෙන තිබීමෙන් පැහැදිලි වන්නේ සමන්ත කූටවණ්ණනා කතුවරයා සමන්කුළු වැණුම සිදු කිරීමට වඩා වැඩි තැනක් බුද්ධ චරිතය වර්ණනා කිරීමට ඉඩ ප්‍රස්තාව ලබාගෙන ඇති බවය. හේන්පිටගෙදර ඤාණසීහ හිමියන් දක්වන්නේ මෙය සමන්කුළු වැණුමකට වඩා බුද්ධචරිත වර්ණනාවක් ලෙසය.[28]

කෘතියෙහි මුලසිට 400 වෙනි ගාථාව දක්වා එන ගාථාවන්හි 1-4 ගාථා මාලිනී වීරිතෙන් ද, (අතිශක්වරී) 5-400 පද්‍ය ශ්ලෝක ඡන්දසෙන් ද වර්ණනා කර ඇත. (320, 334, 400 යන ගාථා පමණක් පාද සයකින් යුක්තය. උපමා, රූපක, දීපක හා ස්වභාවෝක්ති වැනි අර්ථාලංකාර හා ශබ්දාලංකාර උපයෝගී කරගෙන රචිත මෙහි මාලිනී, වසන්තතිලකා, උපජාති, වංසට්ඨ, සිඛරණී, ඉන්ද්‍රවජ්‍රා, භුජංග ප්‍රයාත, ශාර්දූල වික්‍රීඩිත, ස්‍රග්ධරා වැනි වෘත්ත ද, ශක්වරී. අතිශක් වරී, ශ්ලෝක, ජගතී, ත්‍රිෂ්ටුභ්, අතිදෘෂ්ටී. ප්‍රකෘති ආදි ඡන්දස් ද අන්තර්ගතය.

මෙම ගාථා රචනා කිරීමේ දී අවශ්‍ය කරන ඓතිහාසික හා ශාසනික තොරතුරු සපයාගෙන ඇත්තේ ත්‍රිපිටක, අටුවා, ටීකා. ග්‍රන්ථවලින් මෙන් ම පසුකාලීනව රචනා වූ මහාවංස, දීපවංස, වැනි කෘතිවලිනි. බුද්ධචරිතය පිළිබඳ තොරතුරු මහාබෝධිවංස, ථූපවංස, ජිනකාලමාලී, ජිනචරිත වැනි කෘතිවල ද දක්නට ලැබෙන අතර ඒවායෙහි පරමාර්ථය වී ඇත්තේ ද යම්කිසි ස්ථානයක් හෝ පුද්ගලයෙකු පිළිබඳ වර්ණනා කිරීමය. එබැවින් සමන්තකූට

වණ්ණනාවේ අරමුණ සමන්කුළු පව්ව විස්තර කිරීම වුවත් ඒ සඳහා ද මූලික වූ බුද්ධචරිත වර්ණනාව ඉදිරිපත් කර තිබීම වරදක් නොවේ. මහාවංස හා දීපවංස හැරුණුකොට අනෙකුත් ග්‍රන්ථයන්හි දක්නට නොලැබෙන බුදුරජුන්ගේ ලංකා ගමනත්‍රය පිළිබඳ තොරතුරු ගවේෂණය කරන්නෙකුට සමන්තකූටවණ්ණනාව අතිශයින් වැදගත් කෘතියක් වන බව පෙන්වා දිය හැකිය.

ඉහතින් සඳහන් කරන්නට යෙදුන සිද්ධාර්ථ හා බුද්ධ චරිතය, බුදුරජුන්ගේ ලංකා ගමනත්‍රය, සමන්කුළු වැනුම ආදිය වර්ණනා කිරීම සඳහා යොදාගෙන ඇති වර්ණනා චාතුර්යය හා භාෂා ව්‍යවහාරය පිළිබඳ කරුණු ගවේෂණය කිරීමේ දී පැහැදිලි වන්නේ සමන්තකූට-වණ්ණනා කතුවරයා තුළ පැවති ප්‍රතිභා ශක්තියයි. එයිනුත් වඩා විචිත්‍රවත් වර්ණනා කිහිපයක් පෙන්වා දිය හැකිය.

1. ජේතවනාරාම වැණුම
2. යක්ෂ දමන වැණුම
3. මහවැලි ගංගා වැණුම.
4. සමනොළ වැණුම

මෙම වැණුම් ඉදිරිපත් කිරීමේදී පැරණි ත්‍රිපිටකයේ දක්නට ලැබෙන ථේර ථේරී ගාථාවල එන පරිසර වර්ණනා සිහියට නැගේ. ජේතවනාරාමය අසල කිරිපලු නුග රුකෙහි සුමන සමන් දිව්‍ය රාජයා වැඩසිටි ආකාරය හා ඒ හා සම්බන්ධ අවට වර්ණනාවත් සමනළ කඳුයාය පිළිබඳ වර්ණනාව සිදු කර ඇති ආකාරය කාළුදායී තෙරුන්ගේ පරිසර වර්ණනාව නිතැතින්ම සිහියට නැගේ. විවිධ ගස්වල මල් පිපී, ඵල බර වී තිබෙන ආකාරයත් ඒ දෙපස මාර්ගයේ සුන්දරත්වයත් දක්වන්නේ බුදුරජුන්ගේ සෞන්දර්යය නැමති හදවත අවදි කරලමින්ය. එවැනි ම වර්ණනාවක් ජේතවනාරාමය හා ශ්‍රී පාදය පිහිටුවන ලද සමනළ කන්ද පිළිබඳ ව වර්ණනා කර ඇත. එසේම මහවැලි නදියේ ජලය ගලාගෙන යන ආකාරය ථෙරගාථාවන්හි සප්පක තෙරුන්ගේ අජකරණී නදිය සිහියට නැඟේ. කොක් සමූහය මන්ද වූ අන්දකාර අවස්ථාවේ මේඝ ගර්ජනාවෙන් පලා යන ආකාරය මහවැලි නදිය වර්ණනා කිරීමේ දී ද යොදාගෙන ඇති අයුරු දැකගත හැකිය.



සමන්තකූටවණ්ණනාවේ අන්තර්ගත කරුණු විමර්ශනය කිරීමේදී එය ධර්ම ග්‍රන්ථයක් වශයෙන් ද වැදගත් වේ. මෙම ක්‍රමය පැරණි වංසකථාවන්හි දක්නට ලැබෙන්නකි. ප්‍රථම ධර්ම දේශනාව පැවැත්වීම හා බුදුසසුනේ ආරම්භක අවස්ථාවේ දේශනා කරන ලද ධර්ම ත්‍රිපිටකයට ආවේණික වුවත් සමන්තකූටවණ්ණනාවේ දී කතුවරයා රිසි අයුරින් පද්‍ය යොදාගෙන රචනා කිරීමට පෙළඹී ඇති බව පැහැදිලිව දක්නට ලැබේ. එසේම බුදුරජුන් තෙවෙනි වර ලක්දිවට වැඩි අවස්ථාවේ මණි අක් නා රජුගේ ආරාධනයෙන් දම් දෙසූ අවස්ථාව කියවන පාඨකයා තුළ ජීවිතයේ ඇති නිසරු බව මෙන් ම තාවකාලික ස්වභාවය මැනවින් අවබෝධ වේ. එහි දී පුද්ගලයාගේ ජීවිතය කෙමෙන් ගෙවෙන අයුරු හා ජීවිතය තණ අග ඇති පිනි බිඳුවක් සේ වන බව දක්වා තිබේ. චූලෝදර හා මහෝදර දෙදෙනාගේ යුද්ධය පැවති අවස්ථාවේ බුදුරාජාණන් වහන්සේ ඔවුන්ට දහම් කරුණු මගින් එහි ඇති විපාකය පෙන්වා දුන්හ. එකිනෙකාට වෛර කරමින් ඇතිවන ආදීනව පෙන්වා අපායගාමී නොවන ලෙස ද මෛත්‍රී කිරීමෙන් වන ආනිශංස පෙන්වා සමගියේ බලය පිළිබඳ ක්‍රියවෙන කථා පුවත් ද සිත් ඇද ගන්නා සුළුය. යම්කිසි කෙනෙක් තුළ වෛරය. ක්‍රෝධය, ව්‍යාපාදය. මානය ආදිය තිබේනම් ඔවුන් සර්ප, බළල්, බලු, යක්ෂ, වඳුරු ආදි ජාතිවල උපත ලබා ඔවුනොවුන් විනාශ වන බවත් පෙන්වා දෙයි. පෙර කවුඩන් හා කොවුලන් අතරත්, වලසුන් හා කොළොම් ගස් අතරත් ඇති වෛරය අද දක්වා ම පැවතෙන්නේ මේ හේතූන් නිසා බව කියවේ.[29]

## නිගමනයඃ-

මෙසේ සමන්තකූට වණ්ණනාව තුළ අන්තර්ගත වී ඇති තොරතුරු පිළිබඳ කරුණු විමර්ශනයේ දී පැහැදිලි වන්නේ සමන්කුළු පව්ව වර්ණනා කිරීමේ දී ඊට පසුබිම් වූ මූලික තොරතුරු ද අන්තර්ගත කර ඇති බවය. එහිදී බෝධිසත්ව චරිත කථාව, බුද්ධචරිත කථාව වැනි පුද්ගල චරිත හා ජේතවනාරාම, මහවැලි, සමනළ වැනි පරිසර වර්ණනා ද, යක්ෂ දමන, නාග දමන වැනි අද්භූත ආශ්චර්ය තොරතුරුද ඇතුළත් කර ඇත. සමනළ වැණුම මෙහි මූලික තේමාව වුවත් බුද්ධ චරිතය පිළිබඳ ව ද දීර්ඝ විස්තරයක් අන්තර්ගත වන නිසා බුද්ධ චරිත කතා රචනා වූ අනෙකුත් ග්‍රන්ථ හා සන්සන්දනය කිරීමේ දී

සමන්තකූට වණ්ණනාව සුවිශේෂී ස්ථානයක් උසුලනු ලබන බව කිව හැකිය. එහි අන්තර්ගත තොරතුරු අනුව ඓතිහාසික වශයෙන් මෙන් ම සාහිත්‍යයික. සාමාජික, ආගමික, හා සංස්කෘතික වශයෙන්ද වැදගත් වන ග්‍රන්ථයක් ලෙස ද මෙය හඳුන්වාදිය හැකිය.

## ආන්තික සටහන්

[1] ''පශ්චාත් පේටක ප්‍රාග් අට්ඨකථා යුගයට අයත් පාලි සාහිත්‍යය''(ශාස්ත්‍රීය ලිපියකි) ඔලිවර් අබේනායක, **වැලම්විටියාවේ ශ්‍රී කුසලධම්ම ප්‍රශස්ති ශාස්ත්‍රීය සංග්‍රහය,** මරදානඃ ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 2003, පිටු 94-99.

[2] **ඌනපූරණ සහිතො මහාවංසො**, සංස්. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹඃ ඇම්. ඩී ගුණසේන සහ සමාගම, 1959, සෑම පරිච්ඡේදයක් අවසානයේ ම ඇත.

[3] යො යාචිතෝ'රඤ්ඤවාසී ගුණාධාර සුධීමතා
රාහුලත්ථෙර නාමෙන විස්සුතෙන මහීතලෙ

භුවනොදරම්හි පඤ්ඤාතො රවිමම්බර මණ්ඩලෙ
-අරඤ්ඤරතනානන්ද මහාතෙරො මහාගණී

ජීවිතං විය යො සත්ථුසාසනස්ස මහාකවි
සාරො සුප්පටිපත්තීසු සත්ථසාගර පාරගු

තස්ස සිස්සො'සි යො විප්පගාම වංසෙක කෙතුනො
ඤාතාගමො'රඤ්ඤවාසී සීලාදි ගුණභූසණො

යො'කා සීහල භාසාය සීහලං සද්දලක්ඛණං
-තෙන වෙදෙහ ථෙරෙන කතායම්පියසීලිනා

**සමන්තකූටවණ්ණනා,** සංස්. කිරිඇල්ලේ ඤාණවිමල හිමි, කොළඹඃ ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1959, පිටුව 85.

[4] **Samantakutavannana,** ed. C.E. Godakumbura, PTS, London, 1958, p.159.

[5] Norman, K.R., **A History of Literature**, Wiesbaden, 1983, p. 159.

[6] **Samantakutavannana,** 1958, p. ix.

[7] බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, **පාලි සාහිත්‍යය,** නව මුද්‍රණය, කොළඹඃ රත්න පොත් ප්‍රකාශකයෝ, 1999, පිටුව 250.



[8] යො'යං නගො දිස්සති'තො පුරත්ථා - භුමංගනා මොලිසිරිං වහන්තො
සමන්තකූටො'ති සමන්තචක්ඛු - ජානාති ලොකො වසතිං මමෙ'තං
**සමන්තකූටවණ්ණනා,** 1959, පිටුව 74.

[9] 'තත්ථ ධම්මං දෙසයිත්වා සත්ථා ලොකානුකම්පකො
උග්ගන්ත්වා සුමනකූටෙ පදං දස්සෙසි නායකො'
**ඌනපූරණ සහිතො මහාවංසො,** සංස්. 1959, පරි. 1. ගාථාව 77, පිටුව 07.

[10] බුද්ධදත්ත හිමි, **එම**, 1999, පිටුව 389.

[11] **එම**, පිටුව 389.

[12] **සමන්තකූටවණ්ණනා,** 1959, ගාථාව 162, පිටුව 15 .

[13] **දීඝනිකාය**, සක්කපඤ්හ සුත්තං, බු. ජ. මු. 2005, පිටුව 154.

[14] **සමන්තකූටවණ්ණනා**, 1959, ගාථා 175-198, පිටු 16-17.

[15] **එම**, ගාථාව 364, පිටුව 31.

[16] **එම**, ගාථාව 366, පිටුව 15.

[17] **එම**, ගාථාව 367, පිටුව 31.

[18] **එම**, ගාථා 71 - 375, පිටුව 31.

[19] **එම**, ගාථා 446 - 467. පිටු 41-44.

[20] **මහාවග්ග පාළි**, මහාක්ඛන්ධකය, බු. ජ. මු., 2005, පිටු 5-7.

[21] ආහාර කිච්චාදි විවජ්ජිතස්ස
සුඛානුභොන්තස්ස විමුත්තිජානි
සම්පිණ්ඩිතංගස්ස ජිනස්ස තස්ස
ඉච්චච්චගුං සත්තදිනානි සත්ත
**සමන්තකූටවණ්ණනා,** 1959, ගාථාව 470, පිටුව 45.

[22] **මහාවග්ග පාළි,** මහාක්ඛන්ධක, බු. ජ. මු. 1957, පිටුව 8.

[23] කිච්ඡේන මෙ අධිගතං හලන්දානි පකාසිතුං
රාග දොස පරෙතෙහි නායං ධම්මො සුසම්බුධො
පටිසොතගාමිං නිපුණං ගම්භීරං දුද්දසං අණුං
රාගරත්තා න දක්ඛින්ති තමොක්ඛන්ධෙන ආවටාති
**එම,** පිටුව 10.



ශ්‍රී ලංකා භික්ෂු විශ්ව...
16 JUL 2015

[24] **සමන්තකූටවණ්ණනා,** 1959, ගාථා 596-597, පිටුව 63.

[25] **එම**, ගාථා 633-652, පිටු 66-68.

[26] **එම**, ගාථා 718-722, පිටුව 74.

[27] **එම**, ගාථා 513-515, පිටුව 51.

[28] හේන්පිටගෙදර, ඤාණසීහ හිමි, **සමන්තකූට කාව්‍යම්,** ප්‍රථම මුද්‍රණය, බත්තරමුල්ල: සංස්කෘතික දෙපාර්තමේන්තුව, පිටුව 01.

[29] **සමන්තකූටවණ්ණනා**, 1959, ගාථා 578-580, පිටුව 60.